# පිළිතුරක් නොව පැහැදිලි කිරීමකි

සුජීවා ලෝගුස්

පසුගිය සන්නස කලාපයට මා විසින් ලියන ලද මාගේ ලිපිය හරිහැටි තේරුම් නොගෙන එයට පිලිතුරු සැපයු ලංකා ප්‍රේමතිලකට පැහැදිලි කිරීමක් ලෙස මෙම ලිපිය ලියන්නට සිදුවිය. ප්‍රථමයෙන්ම මා සන්නස පුවත්පතට අනේකවාරයක් ස්තූතිවන්ත වන්නේ, අප ජීවත්වන ඕස්ට්‍රේලියානු සිංහල ප්‍රජාව තුල පවතින නොයෙකුත් වැරදි අවබෝධයන් ඔවුන්ට සිදුවන අක්‍රමිකතාවයන් අසාධාරණකම් නිවැරදි කරවීමට ශ්‍රී ලාංකීය අපගේ අදහස්, යෝජනා, චෝදනා නිදහසේ ගොනුකිරීමට අවස්ථාවක් සලසා දීම හේතුවෙනි. මාධ්‍යකින් විය යුත්තේ අප සමාජයට අහිතකර, විනකරන බලපෑම් තෝරා බේරා සත්‍ය සමාජයට වටහාලීමයි. එම කර්තව්‍ය සන්නස පුවත්පත මනාව ඉටුකරලීම ගැන මාගේ කෘතඥතාවය ඔවුන්ට හිමිවේ.

ලංකා ප්‍රේමතිලක මාගේ ලිපියට කොතරම් කුපිත වී ඇත්තේදැයි ඔහුගේ මාතෘකාවෙන්ම පෙනී යයි. (සංස්කාරක සටහන - ලිපියේ මාතෘකාව අප විසින් යොදන ලද්දක් බව කරුණාවෙන් සළකන්න) එමෙන්ම ඔහු (නියෝජනය කරන පාටත් පක්ෂයත් කුමක්දැයි වටහා ගැනීමට මට මෙන්ම මෙය කියවු පාඨක ඔබටද වැඩිවේලාවක් ගත නොවන්නට ඇත. 71 කැරැල්ල පිළිබඳව මා දැනුවත් වී තිබුනේ පතපොත කියවීමෙනි. ඒ මන්ද ඒ වන විට මා බිළිඳියක් වීමයි. එවකට පිළිනොගත් වාමාංශික විප්ලවකාරී පක්ෂයක් වු ජනතා විමුක්ති පෙරමුණේ අවිගත් විප්ලවකාරී කැරළිකරුවන් අත් අඩංගුවට ගැනීමට එවකට පාලන බලයේ සිටි රජය නියෝග කිරීමෙන් අනතුරුව තරුණ තරුණියන් සියගණනක් සිරගතවු අතර නීතිය ඉක්මවා ගිය අරගලකාරී කැරළිකරුවන්ට මරණය පවා අත්විදීමට සිදුවිය.

1976 මගේ ජීවිතයේ අමතක නොවන සිදුවීමක් සිදුවිය. මාගේ පියා අප පවුලේ සියලු දෙනා කැටුව යාපනයේ චාරිකාවක නිරත විය. එහිදී දෙමළ ජනයාගෙන් අප ලද ආගන්තුක සත්කාර, ලෙන්ගතුකම අදටත් සිහිනයක් මෙන් මාගේ මතකයේ රැඳී ඇත. ලංකා ප්‍රේමතිලක හරි හැටි කරුණු සොයාබලා පාඨකයා මංමුලා නොකර කරුණු ඉදිරිපත්කරන්නේ නම් මැනවි. මිනීමරු මෙන්ම වෛරී දේශපාලනයේ ආරම්භකයෝ කවුරුන්ද කියා දන්නෝ දනිති. සරත් ෆොන්සේකා මහතා රටේ යුධ ව්‍යාපාරයේ මෙහෙයවන්න පුරෝගාමී වු යුද වීරවරයෙක් ලෙස මමද පිළිගනිමි. එහෙත් දේශප්‍රේමියකුට දේශද්‍රෝහියෙකු වීමට ගතවන්නේ ඉතා ස්වල්ප වේලාවකි. මක් නිසාද යත් විජයග්‍රහනයේ ටික දෙහක් යනතුරු ඔහු දේශප්‍රේමියෙකු වු අතර මහා පාවාදීමත්, යුධරහස් ලොවට හෙළිකිරීමත් ආදී නොයෙකුත් අසුබවාදී කටයුතු සිදු වුයෙන්

***<u>මල්ලක් බැරිනම් ගෝනි අරගෙන හෝ පක්ෂ ග්‍රාහීව කඩේ යායුත්තේ ශ්‍රී ලංකා භූමියේදී මිසක අප ප්‍රජාවගේ උන්නතිය උදෙසා ඔස්ට්‍රේලියාවෙන් ලබාදී ඇති 3ZZZ ගුවන් විදුලියෙන් නොවන බව මම කියා සිටිමි.</u>***

ඔහු දේශප්‍රේමියෙකුද , දේශද්‍රෝහියෙකුද යන්න මඳක් සිතාබැලිය යුතුය.

සරත් ෆොන්සේකා මහතාගේ යුධ උපක්‍රම මත පමණක් යුද්ධය ජයග්‍රහණය කලේ කියා යමකු සිතනවානම් මා එයට එකඟ නොවෙමි. මීට පෙර පැවති කිසිම රජයක් යුද්ධයේ නිමාව ගැන සිතුවේ නැත. ප්‍රභාකරන්ටත් දරුණු ත්‍රස්ත්‍රවාදයට එරෙහිව තම මාතෘභූමියට, සොබාදහමට හදවතින්ම ආදරය කල, ජාතිභේදයකින් තොරව මුලුමහත් ශ්‍රී ලාංකික වර්ගයාට ආදරය කල ගෞරවනීය

සටන්කාමිත්වයට වීරත්වයට ආදරය කළ කැපවු, ජීවිතය විදු ඩෙන්සිල් කොබ්බෑකඩුව වැනි මහත්මා ගති ඇති උත්මයින්ද යුද්ධ පිටියේ සැබෑ දේශප්‍රේමී වීරයෙන් වුහ. එහෙත් එද පෙනි පෙනී තිබු යුධජයග්‍රහනයට එරෙහි වූයේ කවුරුන්ද? එවකට පැවති පාලකයින්ගේ අත්වල එතුමන්ගේ ලේ තැවරු-

***<u>මාගේ තර්කය වනුයේ අප ප්‍රජා ගුවන් විදුලිය පක්ෂග්‍රාහී හෝ කුමන ආකාරයකින් දේශපාලන ගුවන් විදුලියක් කරගැනීම ශ්‍රාවකයින් වශයෙන් අපේ විරෝධය පළ කිරීමයි.</u>***

නේ නිකම්ම නෙවේ. එදමෙන් අද පවතින වර්තමාන රජය ක්‍රියාකලේ නම්, සරත් ෆොන්සේකා මහතාට යුද්ධයේ ජයග්‍රහණය වෙත ලඟා වීමට ඉඩ නොතිබිනි.

එද ඩෙන්සිල් කොබ්බෑකඩුව දේශප්‍රේමී වීරවරයාට ත්‍රස්ත්‍රවාදය පරද දිනුම් කණුව වෙත ළඟා වීමට අවසරය නොලද්දේ මක්නිසාද? මහින්ද රාජපක්ෂ රජයෙන් ෆොන්සේකා මහතාට යුද්ධය අවසන් කිරීමට නියෝගයක් අතැතිව අහිංසක සෙබලු දසදහස්ගානකගේ ජීවිත පරදුවට තබා අතිගරු ජනාධිපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ අප රට දෙවනවරටත් නිදහස ලැබීය. එසේ නොවුනානම් අදටත් අප රට අනාගත පරපුරට හෙටක් නැති කුරිරු යුද්ධයෙන් හෙම්බත් වී අඳුරු වු මුසලම වර්තමානයක් බවට පත් වී හමාරය. ශ්‍රී ලංකාවේ මුලුමහත් සාමාජික ව්‍යුහයක් රටේ සංවර්ධනයක් අඩාල කරමින් තැන තැන පිපිරවු සිත්පිත් නැති බෝම්බයෙන්, ත්‍රස්ත්‍රවාදයෙන් පිඩාවිදි ජනතාව, ආබාධිතවුවන් මෙන්ම ප්‍රභාකරන් නැමති මිනීමරු ත්‍රස්ත්‍රවාදීයාට බියේ පිච්චි පිච්චි ජීවිත ගෙවු මායිම් ගම්මානවල අසරණ ජනතාවත්, මුලුමහත් ශ්‍රී ලංකාකි වැසියන් 30 වසරකට පසුව පවතින රජය මුලුමනින්ම කොටි වනසා රට එක්සේසත් කල හෙයින් මෙවර සිංහල දෙමළ අලුත් අවුරුද්ද සිතින් බිය සැකයකින් තොරව සැමරුවෝය.

සිරිල් ධර්මවර්ධන ඉතා දක්ෂ කලාකරුවකු බව මම අවිවාදයෙන්ම පිලිගතිමි. කලාකරුවන් බුරුතුපිටින් එක් එක් පක්ෂ නියෝජනය කරමින් කඩේ ගියේ අප සිංහල ප්‍රජාවගේ ගුවන්විදුලි නාලිකා තුලින් නොවේ. මල්ලක් බැරිනම් ගෝනි අරගෙන හෝ පක්ෂ ග්‍රාහීව කඩේ යායුත්තේ ශ්‍රී ලංකා භූමියේදී මිසක අප ප්‍රජාවගේ උන්නතිය උදෙසා ඔස්ට්‍රේලියාවෙන් ලබාදී ඇති 3ZZZ ගුවන් විදුලියෙන් නොවන බව මම කියා සිටිමි. ලංකා ප්‍රේමතිලක මාගේ ලිපිය වරදවා තේරුම් ගෙන ඇත්තේ මෙතැනදීය.

මාගේ තර්කය වනුයේ අප ප්‍රජා ගුවන් විදුලිය පක්ෂග්‍රාහී හෝ කුමන ආකාරයකින් දේශපාලිත ගුවන් විදුලියක් කරගැනීම ශ්‍රාවකයින් වශයෙන් අපේ විරෝධය පළ කිරීමයි. ඕස්ට්‍රේලියාවේ ජීවත්වන කිසිම කලාකරුවකු සිරිල් ධර්මවර්ධන මෙන් එවැනි පහත් දේශපාලනික සංවාද වලට ඔස්ට්‍රේලියානු භූමිය තුලදී සහභාගි වී නැතිබව මා අවධාරණයෙන් යුතුව දන්වා සිටිමි. ලංකා ප්‍රේමතිලක සිරිල් ධර්මවර්ධනගේ එම සංවාදය නිර්භීත එඩිතර ප්‍රකාශයක් ලෙස පෙනුනේ ඔහුගේම පාට කන්නාඩිය අඳුරේම පළඳවා ගත් නිසාද? එය එඩිතරකමවත්, නිර්භීත කමවත් නොවෙයි සිරිල් ධර්මවර්ධනගේ පක්ෂග්‍රාමී බවයි. සිරිල් ධර්මවර්ධන ඒ තරමට නිර්භීතව අදහස් පලකරන්නේ නම් ඔහුගේ වගකීම වියයුත්තේ ශ්‍රී ලංකා භූමිය තුලදී ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය ගෙනයාමයි. එමෙන්ම ඔහු දේශප්‍රේමී, රටට ආදරය කරන අවංක පුද්ගලයෙකුද කියා ඇසිය යුත්තේ සිරිල් ධර්මවර්ධනගේම පපුවට තට්ටුකරමිනි.

3ZZZ ගුවන් විදුලියේ පසුගිය සතියක බ්‍රහස්පතින්දවක රාත්‍රී විකාශයට මම සවන් දුනිමි. හෝරා කිහිපයක් එම වැඩසටහන් විකාශය වු අතර එළඹෙන දිනය මහසිකුරාද කියා වැඩසටහන මෙහෙයවු නිවේදකයාට අමතක වුයේ මන්ද? කතෝලික බැතිමතුන් මෙම දිනය සමරන්නේ ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගස්ත වු දිනය ලෙසනි. බොහෝ ශ්‍රී ලාංකික කතෝලික බැතිමතුන් මස් මාංශයෙන් වැලකී තමන්ගේ කුසට ගන්නා ආහාර වේලද , නැතිබැරි අයකුට දන් දෙමින් මෙම දිනය සමරති. කොටින්ම කිවහොත් ක්‍රිස්තුන්වහන්සේ කුරුසයේ ඇණගසා මරණයට පත්වුයේ මෙවැනි දිනයක දීය. එහෙයින් කතෝලික බැතිමතුන් එම දිනය ශෝක දිනයක් ලෙස සමරන්නේ ඉතාමත් භක්තියෙකින් යුතුවය. එදා වැඩසටහන මෙහෙය වු නිවේදකයාට 71 කැරැල්ල නම් අමතක වී නොතිබිනි. කිසිම පෙරසුදනමක් නැතිව විකාශය කරන මෙවැනි වැඩසටහන් මුදහරිනු ලබන්නේ කුමක් අරභයාද? එහෙම නැතිනම් මහසිකුරාද ගැන, හෝ ජේසුස් වහන්සේගේ චරිත කතාව ගැන හරිහැටි කරුණු සොයා ගැනීමට තරම් දැනුමක් ඔවුන්ට නොතිබුණද ?

කෙසේ වෙතත් මෙවැනි වැඩසටහන් වලට කිහිපදෙනෙක් හෝ සවන් දෙනබවත් එහි අන්තර්ගතය ගැන විමසිලිමත් වන බවත් මෙම වැඩසටහන් මෙහෙයවන පුද්ගලයන් සිහිතබාගත යුතු වන්නේය. අප්‍රේල් මාසය වු කලී සිංහල බෞද්ධ, කතෝලික, දෙමළ සියලු ජනවර්ගයාටම ඉතාමත් සුවිශේෂී මාසයකි. කරුණු වුවත් 3ZZZ ගුවන්විදුලිය අනාගතයේදී කබලෙන් ලිපට නොවැටී හුදෙක් සිංහල ප්‍රජාවගේ උන්නතිය උදෙසා අර්ථවත්, නව මාවතක් ඔස්සේ පියමං කිරීමට හේතුවාසනාව පෑදේවා. ශ්‍රාවකයිනි එය ඔබේත් මගේත් වගකීමයි.

## වෛද්‍ය කිංස්ලි ජෝසප් මහතා ගේ නවතම වෛද්‍ය සායනය




ජනප්‍රිය සහ දක්ෂ ශ්‍රී ලාංකික වෛද්‍යවරයකු වන කිංස්ලි ජෝසප් මහතා ගේ නවතම වෛද්‍ය සායනය චයිල්ඩ්ස් රෝඩ් මිල්පාක් හිදී පසුගිය දා විවෘත කෙරුණි. ඔහු සමග කෙටි සංවාදයක යෙදෙන්නට අපට පස්ගිය දිනෙක අවස්ථාව උදාවුණි.

***ඔබ මෙවැනි වෛද්‍යායතනයක් ආරම්භ කරන්නට තීරණය කළේ ඇයි?***

මම පසුගිය කාලයේ විවිධ වෛද්‍යආතෙන වල සේවය කළා. එහිදී මට ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් හමුවුණා. ඒ එක්කම නිවාඩු ගත කිරීම සඳහා මෙහි පැමිණෙන දෙමාපියන්ද විවිධ අසනීප වලට ප්‍රතිකාර ගන්නට මා හමුවන්නට ආවා. මෙහිදී මට තේරුණ දෙයක් තමයි මේ සියලු දෙනාටම අවශ්‍ය වෛද්‍ය පහසුකම් සැපයීමට අපේම වූ ආයතනටක් ආරම්භ කිරීම සුදුසු බව. ඒ අනුව තමයි මේ ඇල්ෆා මෙඩිකල් ක්ලිනික් ආයතනය මම ආරම්භ කළේ.

***මෙහි ඇති පහසුකම් මොනවාද?***

වෛද්‍යවරුන් හමුවීමේ ඉඩකඩ සමග සියලුම වෛද්‍ය පරීක්ෂණ මෙහිදී කරගන්නට ඉඩ සැළසෙනවා. එසේම දන්ත වෛද්‍ය පහසුකම් පවා මෙහිදී ලබා ගන්නට පුලුවන්. චර්ම රෝග, හෘද රෝග, පිසියෝ තෙරපි වැනි සියලුම පහසුකම් මෙහිදී ලබා ගන්න පුලුවන්.

මගේ එකම බලාපොරොත්තුව මෙහි පැමිණෙන සියලුම දෙනාට උපරිම සේවයක් ලබා දීමයි. ඒ වෙනුවෙන් මා සමග විශේෂඥ වෛද්‍යවරුන් රැසක් මේ සඳහා කැප වී සිටිනවා.

මිල්පාක්, ලේලෝ, තෝමස්ටවුන්, බන්දූරා, සවුත් මොරෑන්ග් වැනි ප්‍රදේශවල වෙසෙන සියලු දෙනාටම මිල්පාක් හි ඇල්ෆා ක්ලිනික් ආයතනයෙන් සුවිශාල සේවයක් ලබා ගත හැකි වනු ඇති බව අපට විශ්වාසයි.

Alpha Medical Clinic 351 Childs Road
Mill Park Vic 3082 Tel - 9404 4888

ශ්‍රීනාත් මද්දුමගේ